# ඔබ සෞඛ්‍ය රක්ෂණය ගැන දැනුවත් ද?





## සෞඛ්‍ය රක්ෂණය කියන්නේ මොකද්ද?

රෝගී වුණ අවස්ථාවකදී, හදිසි අනතුරකදී, අකර්මණ්‍යතාවයකදී හෝ රෝහල්ගත වීමකදී වෛද්‍ය ප්‍රතිකාර වෙනුවෙන් ඔබට දැරීමට සිදුවන වියදම පියව ගන්න තමයි සෞඛ්‍ය රක්ෂණයක් ගන්න අවශ්‍ය වෙන්නේ. වාරිකය නිසිවෙලාවට ගෙවාගෙන ගියාම ඔප්පුවේ තියෙන කොන්දේසිවලට යටත්ව අදාල වියදම ප්‍රතිපූරණය කරගන්න පුළුවන්.

## සෞඛ්‍ය රක්ෂණය වැදගත් ඇයි?

විවිධ රෝගාබාධ, හදිසි අනතුරු, ශල්‍යකර්ම, වගේ දේවල් ඕනෑම කෙනකුගේ ජීවිතයට හදිසියේ එන්න පුළුවන්. එහෙම වෙලාවක ඒ යන වියදම පියවා ගන්න නැත්නම් ප්‍රතිපූරණය කරගන්න සෞඛ්‍ය රක්ෂණය ඉතා වැදගත්. සෞඛ්‍ය රක්ෂණාවරණයක් නොතිබුණහොත් මෙවැනි වියදම් පියවීමට සිද්ධවෙන්නේ ඔබගේ ඉතිරිකිරීම් වලින් හෝ ණය මුදලක් ලබාගැනීමෙන්.





## ඔබට ගැලපෙනම සෞඛ්‍ය රක්ෂණාවරණය තෝරා ගන්නේ කෙසේද?

ඔබගේ අවශ්‍යතා සහ තේරීම මත නොයෙක් ආවරණ සපයන සෞඛ්‍ය රක්ෂණ වර්ග තියෙනවා. ඔබට ගැලපෙනම රක්ෂණාවරණය තෝරා ගැනීමට නම් දැනට වෙළඳපොළේ පවතින සෞඛ්‍යරක්ෂණාවරණ ගැන සොයා බලා, ලියාපදිංචි රක්ෂණ සමාගමකින්, රක්ෂණ තැරැව්කාර සමාගමකින් හෝ සුදුසුකම් ලත් රක්ෂණ නියෝජිතයකුගෙන් උපදෙස් ලබාගන්න පුළුවන්.



## රක්ෂණ ඔප්පුවේ සැලකිලිමත් වෙන්න ඕන දේවල් මොනවද?

සෞඛ්‍ය රක්ෂණයක් ගනිද්දී රක්ෂණ ඔප්පුව හොඳට කියවන්න. රක්ෂණාවරණයෙන් ලබා දෙන ප්‍රතිලාභ, ආවරණය කරන රෝගාබාධ, වගේම ප්‍රතිලාභ ගෙවද්දි සීමා පනවල තියෙනවද, කිසිසේත්ම ආවරණය නොවන රෝගාබාධ මොනවාද?, ඒ වගේම, රක්ෂණාවරණයක් ලබා ගැනීමේදී සම්පූර්ණ කරන්න ඕන කොන්දේසි මොනවද?, මේ සියල්ල රක්ෂණ ඔප්පුවේ සඳහන් වෙනවා.



වැඩිදුර තොරතුරු සඳහා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ සමාජ මාධ්‍යජාලා වෙත පිවිසෙන්න


**ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව**

11 මහල, නැගෙනහිර කුළුණ, ලෝක වෙළෙඳ මධ්‍යස්ථානය, කොළඹ 01.

දුරකථන : (011) 2396184-9 ෆැක්ස් : (011) 2396190

ඊ-මේල් info@ircsl.gov.lk වෙබ් : www.ircsl.gov.lk